# මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 03 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 16 උනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 19 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.87,874,929 ක් වටිනා ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.797,709 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,570,612 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) වරිපනම් බදු | 534 | 537 | 100 |
| (ii) බදු කුලී | 1,899 | 1,480 | 98 |
| (iii) බලපත්‍ර ගාස්තු | 429 | 390 | 45 |
| (iv) වෙනත් ආදායම් | 4,733 | 4,156 | 25,834 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 115,800 |
| (ii) | මුද්දර ගාස්තු | 1,530,000 |

2.2.3 දුරකථන කුළුණු ගාස්තු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) තෙලිජ්ජවිල නාකන්දගොඩවත්ත - දුරකථන කුළුණ ඉදිකිරීම

(i) කුළුණ ඉදිකිරීම සඳහා සංවර්ධන බලපත්‍රයක් සභාව මගින් නිකුත් කර නොතිබුණද එකී දුරකථන කුළුණ ඉදිකර භාවිතා කරමින් තිබූ බව 2012 ජුනි 01 දින භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ii) නාගරික සංවර්ධන අධිකාරියේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරණ ගැසට් නිවේදනයක් 5 වන කොටසේ 6 (v) පරිදි සභා අනුමැතියකින් තොරව ඉදිකල මීටර් 40 ක් උසැති කුළුණ සඳහා රු.80,000 ක ගාස්තු අයකල යුතු වුවද රු.30,000 ක් පමණක් අයකර තිබුණි.

(iii) මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂකගේ 2008 ජුලි 02 දිනැති ලිපිය හා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂකගේ 2008 ජුනි 12 දිනැත ලිපි මගින් කුළුණ ඉදිකිරීමට ප්‍රථම අදාල පළාත් පාලන ආයතනයෙන් පූර්ව අනුමැතිය ලබාගත යුතු බව දක්වා ඇතත් කුළුණ ඉදිකල ආයතනය එකී නියමයන් ඉටුකිරීම පැහැර හැර තිබුණි.

(iv) සභාපතිවරයාගේ 2009 ජුලි 15 දිනැති ලිපියෙන් කුළුණ ඉදිකිරීම නීත්‍යානුකූල නොවන හෙයින් ඉදිකිරීම නතර කර ඉදිකල කොටස් කඩා ඉවත් කරන ලෙසට අදාල සමාගම වෙත දන්වා ඇතත් 2012 ජුනි 01 දිනැති භෞතික පරීක්ෂණ අවස්ථාව වන විටද එකී නියමය පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) පොල්අරඹේගොඩ දුරකථන කුළුණු .

පොල්අරඹේගොඩහේන දුරකථන කුළුණ සඳහා මීටර් 60 ක උස ප්‍රමාණය සඳහා අයවිය යුතු ගාස්තුව රු.24,000 ක් වුවද රු.22,000 ක් පමණක් අයකර තිබුණි.

2.2.4 කඩකාමර කුලී.

පහත කරනු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) මාලිම්බඩ පොදු වෙළඳ පොල කඩ කාමර 22 ක් හා තෙලිජ්ජවිල පොදු වෙළඳපොල කඩ කාමර 05 ක් සඳහා 2012 වර්ෂයට ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ii) කඩ කාමර තක්සේරු කර වසර 05 ක් ගතවී තිබූ නමුත් තක්සේරු කුලී සංශෝධනය කර නොතිබුණි.

(iii) දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2010 සැප්තැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරණ චක්‍රලේඛය පරිදි කඩකාමර බදුදීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

2.3 මානව සම්පත් කළමනාකරණය

(අ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 26 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 44 දෙනෙක් විය.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව කාර්ය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා වූ වියදම රු. 7,976,993 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ රු.6,198,720 ක් වූයෙන් රු. 1,778,273 ක් වූ වෙනස සභා අරමුදලට වැයබරක් වී තිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවාගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 18 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සභා අරමුදලින් රු. 1,453,983 ක මුදලක් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකලහොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි.

සභා සේවකයින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය වටිනාකම රු.28,132,295 ක් විය.

2.4 කළමනාකරණ අකාර්යක්ෂමතා.

වීථි පහන් නඩත්තුව.

(i) සභා බල ප්‍රදේශයේ ලංකා විදුලි බල මණ්ඩලයේ අනුමත වීථි පහන් සංඛ්‍යාව 90 ක් වුවද පහන් 1050 ක් සවිකර විදුලි උපාංග වෙනුවෙන් රු.269,892 ක් වැයකර තිබුණි.

(ii) සභාව විසින් රු.285,942 ක් නඩත්තු වියදම් සඳහා වැයකර තිබුණද ලංකා විදුලි බල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය වී තිබුණේ රු.36,036 ක් පමණක් වූයෙන් රු.249,906 ක අතිරේක වැය බරක් දැරීමට සභාවට සිදුව තිබුණි.

2.5 කාර්ය සාධනය.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය දක්වන සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් 2003 ජුනි 02 දිනැති අංක පීඩ්/12 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05 ඡේදය පරිදි සමාලොචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

(ආ) සභාව 2007 සිට 2010 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා සිව් අවුරුදු සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර තිබුණි.

(i) සංවර්ධන සැලැස්මේ ඉටුකරන කාර්යයන් පමණක් දක්වා තිබූ අතර එක් එක් කාර්යය සඳහා ඉලක්කගත වියදම ඒවා ඉටුකරන කාල පරිච්ඡේද යනාදිය ඇතුලත්වී නොතිබුණි.

(ii) සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 29 ක් ආවරණය වන පරිදි සහභාගීත්ව සැලසුම් කමිටුවක් හා උපකමිටු 29 ක් පිහිටුවා ඇතත් එකී කමිටු ක්‍රියාත්මක වූ බවට තොරතුරු නොවීය.

(iii) පහත සඳහන් කාර්යයන් ඉටුකිරීමට ඉලක්ක කර තිබුණද ඒවා ඉටුවූ බවට තහවුරු කෙරෙන ප්‍රගති වාර්තා පිළියෙල වී නොතිබුණි.

- ❖ සෞඛ්‍යය හා සනීපාරක්ෂක සේවා
- ❖ භෞතික යටිතල පහසුකම්
- ❖ සමාජ සේවාවන්
- ❖ ආර්ථික සංවර්ධන, ආයෝජන හා පරිසර.

(ඇ) සභාව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.6 සභා මන්ත්‍රී යෝජනා හා පගතිය.

(i) මන්ත්‍රීවරුන් 09 දෙනෙකගෙන් සමන්විත සභාව සමාලෝචිත වර්ෂයේදී රු.618,000 ක් මන්ත්‍රී වැටුප් සඳහා වැයකර තිබූ අතර 2011 වර්ෂයේ පැවැත්ව සභා රැස්වීම් වාර 12ටම සහභාගී වී තිබුණේ මන්ත්‍රීවරුන් 08 දෙනෙකු පමණි.

(ii) සමාලෝචිත වර්ෂයෙ අයවැය ලේඛණයේ ප්‍රාග්ධන වියදම් යටතේ සභා මන්ත්‍රී වැඩ යෝජනා ඇතුලත් කර නොතිබුණි. ඉදිරිපත්ව තිබූ වැඩ යෝජනා 58 කින් 39 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(iii) තුන් අවුරුදු සැලැස්ම යටතේ සභා බල ප්‍රදෙශය තුල ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘති මාර්ග 17 ක්, හා වෙනත් යෝජනා 08 ක ව්‍යාපෘති ලැයිස්තුවක් අයවැය ලේඛණයේ දක්වා තිබුණද එකී ඇස්තමේන්තුගත වටිනාකම් දක්වා නොතිබුණ අතර ඉන් එකදු ව්‍යාපෘතියක්වත් ක්‍රියාත්මක කර නොතිබුණි.

2.7 අභ්‍යන්තර විගණනය.

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණ.

3. පද්ධති හා පාලන.

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ගබඩා පාලනය